www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊයේ පෙරමුනු කන්ඩායමක් ශ්‍රී ලංකාවේ බෝම්බ පිපිරවීම්වල වගකීම භාර ගනියි

## LTTE front group claims responsibility for Sri Lankan bombings

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2008 ජූනි 21**

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පෙරමුනු සංවිධානයක් වන එල්ලාලන් බලකාය, මෑත සතිවල දී දකුනුදිග ශ්‍රී ලංකාවෙහි බස් රථ සහ දුම් රිය තුල සිදු කෙරුනු බෝම්බ ප්‍රහාර මාලාව පිලිබඳ වගකීම භාර ගෙන තිබේ. කොලඹ ද ඇතුලු ප්‍රදේශ ගනනාවක දී සිදු කෙරුනු මෙම පිපිරවීම් හේතු කොට ගෙන අහිංසක සිවිල් වැසියන් 34 දෙනෙකු ඝාතනයට ලක් වී ඇති අතර සිය ගනනක් දෙනා තුවාල ලබා තිබේ.

එල්ටීටීඊයට හිතවාදී *ටැමිල්නෙට්* වෙබ් අඩවිය, එල්ලාලන් බලකාය නිකුත් කල ප්‍රකාශයක් උපුටා දක්වමින් ජූනි 10 වන දා වාර්තාවක් පල කලේ ය. එම ප්‍රකාශයෙහි මෙසේ කියා තිබුනිඃ "ශ්‍රී ලංකාන්ඩුවේ හා එහි හමුදාවල එල්ආර්ආර්පී ප්‍රහාර සහ ගුවන් බෝම්බ ප්‍රහාර ... වලට දැඩිව පිළිතුරු දීමක් වශයෙන් ප්‍රවාහන රථවල දී සිදු කෙරුනු බෝම්බ ප්‍රහාර සහ අනෙකුත් ප්‍රහාර සම්බන්ධයෙන් අප වගකීම භාර ගන්නා බව කියා පෑමට අපට අවශ්‍ය ය." (එල්ආර්ආර්පීය හෙවත් දීර්ඝ පරාස පිරික්සුම් මුර සංචාරක බලකාය යනු ශ්‍රී ලංකා මිලිටරියේ රහස් මෙහෙයුම් ඒකකය වෙයි.)

බෝම්බ ප්‍රහාර මගින් අවධාරනය වන්නේ එල්ටීටීඊයේ බෙදුම්වාදී ඉදිරි දර්ශනයේ ප්‍රතිගාමී ස්වභාවය යි. ළමුන් බොහොමයක් ද ඇතුලුව අහිංසක සිවිල් වැසියන් ඉලක්ක කර ගනිමින් සිදු කරන ලද මේ බෝම්බ ප්‍රහාර වනාහි හුදෙක් සාහසික අපරාධ පමනක් ම නො වේ. ඒවා සිංහල, දෙමල හා මුස්ලිම් වැඩ කරන ජනයා අතර එක හා සමානව පැතිර යමින් පවත්නා වැඩෙන අත්‍යප්තිකර භාවයට අභිමුඛව සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂගේ අර්බුද ග්‍රස්ත ආන්ඩුවට ආධාර කරන්නේ ද වේ. ඉහල යන උද්ධමනයට සහ යුද වියදම්වලට එරෙහිව ගුරුවරුන් හා අනෙකුත් කම්කරුවන් වැටුප් අරගලවල යෙදෙන්නට පරිශ්‍රම දරන තත්ත්වයේ දී, වැඩ කරන ජනයා බෙදා ලීම සඳහා විශේෂයෙන් සිංහල සහ දෙමල ජනයා අතර වාර්ගික වෛරය අවුලුවන අතරවාරයේ දෙමල සුලුතරයට එරෙහිව ගෙන යන කුරිරු යුද්ධය යුක්ති සහගත කිරීමට යොදා ගත හැකි එලදායී කඩතුරාවක් මේ පිපිරවීම්වලින් ආන්ඩුව වෙත සම්පාදනය වේ.

එල්ලාලන් බලකායේ ප්‍රකාශයට ප්‍රතිචාර දක්වමින් එල්ටීටීඊයේ මිලිටරි ප්‍රකාශක ඉරාසියා ඉලන්තිරායන් බීබීසීයේ දෙමල සේවාව වන තමිලොසෛයි ගුවන් විදුලියට කියා සිටියේ, එල්ටීටීඊයට මේ කන්ඩායම සමග කිසිදු සම්බන්ධයක් නැති බව යි. මැයි 30 වන දා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක දී, එල්ටීටීඊයේ දේශපාලන නායක බී. නඩේසන් ද මෑත දී සිදු වූ බෝම්බ පිපිරවීම් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කලේ ය.

මේ ප්‍රතික්ෂේප කිරීම් පවතින මුත්, එල්ලාලන් බලකාය දශකයක පමන කාලයක් තිස්සේ එල්ටීටීඊය වෙනුවෙන් ක්‍රියාකාරී වී ඇත. ද්‍රෝහීන් යයි චෝදනා කරමින්, පෙරමුනු කන්ඩායම උතුරෙහි ආන්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල දී දෙමල සිවිල් වැසියන්ට එරෙහිව ප්‍රහාර ගනනාවක් ම ක්‍රියාත්මක කොට තිබේ. සාමාන්‍ය ජනයා ඉලක්ක කර ගනු ලැබ ඇත්තේ මිලිටරිය හා සහයෝගී වීම හෝ එල්ටීටීඊයේ දේශපාලන විරුද්ධවාදීන් බවට පත් වී සිටීම පිලිබඳව චෝදනා කරමිනි.

කොලඹ ආන්ඩුව ආන්ඩුවට හිතවාදී සන්නද්ධ කන්ඩායම් විසින් සිදු කරනු ලබන දෙමල සිවිල් වැසියන් ඝාතනය කිරීම් සම්බන්ධ වගකීම ප්‍රතික්ෂේප කර ඇත්තාක් මෙන් ම, එල්ටීටීඊය තමන් තම ඒජන්ත කන්ඩායම් හරහා සිවිල් වැසියන් ඝාතනය කොට තිබෙන බවට එල්ල කෙරෙන මොන ම චෝදනාවක් වුව ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වුව ද, ජනවාර්ගික සිංහල කම්කරුවන්ට හා ගොවීන්ට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම පිලිබඳ දීර්ඝ වාර්තාවක් එල්ටීටීඊයට ද තිබේ. උදාහරනයක් ලෙස, පුද්ගලයන් 91 දෙනෙකු ඝාතනයට ලක් කරමින් හා 1,400කට ආසන්න සංඛ්‍යාවකට තුවාල සිදු කරමින් 1996 දී එය ශ්‍රී ලංකා මහ බැංකුවේ දී විනාශකාරී මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කලේ ය.

"පලි ගැනීම පිලිබඳව දැඩිව අනතුරු ඇඟවීමක්" යන මැයෙන් යුතු එල්ලාලන් බලකායේ ප්‍රකාශයෙන් වර්ගවාදයේ දුගඳ විහිදුනි. එය මුලු මහත් සිංහල ජනයාට ම මෙසේ තර්ජනය කලේ යඃ "සිංහලයන් තත්ත්වය පැහැදිලිව තේරුම් ගත යුතු යි, 'එල්ලාලන් බලකාය' තම ප්‍රහාර නොකඩවා කර ගෙන යන්නේ මන්ද යන්න ගැන සිතා බැලිය යුතු යි." "සිංහල සිවිල් වැසියන්" දෙමල සිවිල් වැසියන් මත එල්ල කරන "

ප්‍රහාර නතර කිරීමට ආන්ඩුවට බල කල යුතු" යැයි ඉල්ලා සිටි එම ප්‍රකාශය, නැත් නම් තව තවත් සිංහල ජනයා ඝාතනයට ලක් වනු ඇති බව ද සඳහන් කලේ ය.

මේ කියමන්වලින් ප්‍රතිරාවය කෙරෙන්නේ දෙමල ජනතාව මර්දනය කිරීම සම්බන්ධයෙන් මුලු මහත් " සිංහල ජාතිය" ම වගකිව යුතු ය යන එල්ටීටීඊයේ මතවාදය යි. සැබවින් ම, 1980 ගනන්වල දී දෙමල සුලුතරයට එරෙහිව සිවිල් යුද්ධයක් දියත් කිරීමෙන් කුලු ගැන්වුනු වර්තමාන හෝ කලින් පැවති කොලඹ ආන්ඩුවල දෙමල විරෝධී පිලිවෙත සමග සිංහල කම්කරුවන්ට සහ ගම්බද දුගීන්ට කිසිදු සම්බන්ධයක් නැත. 1948 දී නිදහස ලද දා පටන්, දෙමල ජනයාට එරෙහිව වෙනස්කම් කිරීම සිංහල පාලක ප්‍රභූවේ තීරනාත්මක දේශපාලන අවියක් වී තිබේ. කම්කරු පන්තිය වෙතින් එල්ල වුනු මොන යම් අභියෝගයක් වුව භේද භින්න කිරීමටත් ඊට යටි වල කැපීමටත් එය යොදා ගන්නා ලදි. 2006 දී රාජපක්ෂ විසින් යලි ආරම්භ කරන ලද යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස, ජීවන තත්ත්වයන් පිරිහීමෙන්, ආර්ථිකය එක තැන පල් වීමෙන් හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මත එල්ල වන බරපතල ප්‍රහාරයන්ගෙන් සියලු ජනවාර්ගික පසුබිම්වලට අයත් වැඩ කරන ජනයා පීඩා විඳ ඇත.

එල්ටීටීඊයේත් එහි පෙරමුනු සංවිධානවලත් දෘෂ්ටිය පදනම් වී තිබෙන්නේ දෙමල-හින්දු ස්වෝත්තමවාදය මත ය. දෙමල ජාතිකයන්ගේ කාර්ය භාරය අපකීර්තියට පත් කිරීමේ දී කොලඹ බෞද්ධ-සිංහල අධිපතිවාදීන් " සිංහල ජාතියේ" ඉපැරනි ශ්‍රී විභූතිය වෙත අවධානය යොමු කරන්නා සේ ම, එල්ලාලන් බලකාය එනමින් නම් කරන ලද්දේ ක්‍රි.පූ. 235 සහ 161 අතරතුර කාලයේ දී උතුරුමැද පලාතේ පිහිටි අනුරාධපුරයේ සිට රජකම් කල බවට පුරාවෘත්තයන්හි සඳහන් වන දෙමල රජ කෙනෙකුගේ නම අනුව ය.

එල්ටීටීඊයේ ඉදිරි දර්ශනය වන්නේ, ඊනියා "දෙමල නිජබිම" වන උතුරෙහි හා නැගෙනහිරෙහි, තමන් විසින් සාමාන්‍ය දෙමල කම්කරුවන් සූරා කනු ලබන තමන්ගේ ම වූ ධනවාදී රාජ්‍ය කැබලිත්තක්, නිර්මානය කිරීම යි. එය නියෝජනය කරන්නේ, කොලඹ ආන්ඩුවට එරෙහිව දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් සහ දුගීන් අතර එකමුතුව සඳහා මොන යම් හෝ ආයාචනයක් කිරීමට අසමත් වූත් එවැනි ආයාචනයකට සතුරු වූත් දෙමල ධනේශ්වරයේ කොට්ඨාසයකි. එය එවන් එකමුතුවක් සඳහා ක්‍රියා කරනවා නොව, අහිංසක සිංහල සිවිල් වැසියන් මත පලි ගැනීමේ ප්‍රහාර එල්ල කිරීමේ පිලිවෙත වැලඳ ගෙන සිටියි.

## නිවුන් දේශපාලන අර්බුද

යුද්ධය යලි ආරම්භ කිරීම මගින් එල්ටීටීඊය සහ ආන්ඩුව යන දෙපාර්ශ්වයේ ම දේශපාලනික බංකොලොත් භාවය එලිදරව් වී ඇත.

රාජපක්ෂ යුද්ධය යලි ආරම්භ කිරීම කරා තල්ලු කෙරුනේ, ගෝලීය ආයෝජකයන්ට ආර්ථිකය විවෘත කර ලීමේ සිය ක්‍රියා මාර්ගය මගින් පැන නැංවුනු සාමාජීය ආතතීන් විසඳීමෙහි ලා සමස්ත කොලඹ දේශපාලන සංස්ථාපිතය ම අසමත්ව ඇති හෙයිනි. ආන්ඩුව රඳා පවතින්නේ, ඇමතිවරුන් 100කට වැඩි ගනනකින් සමන්විත අස්ථාවර සන්ධානයක් මත ය. මෙය ලෝකයෙහි පවත්නා විශාලතම ඇමති මන්ඩලය යි. ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය (ජාහෙඋ) වැනි සිංහල අධිපතිවාදී පක්ෂවලට ද මිලිටරි නායකත්වයේ සහ රාජ්‍ය නිලධරයේ කොටස්වලට ද දෙමල සුලුතරයට එරෙහිව දශක ගනනාවක් තිස්සේ දිගින් දිගට සිදු කර ගෙන එන වෙනස්කම් කිරීම තුල මුල් විහිදී ගත් බලගතු අවශ්‍යතා තිබෙන අතර, දෘෂ්ටිවාදීමය වශයෙන් ගත් විට ඔවුහු ඒ වෙනස්කම් කිරීම මත රඳා පවතිත්.

කෙසේ වුව ද, හමුදාව විඳ ඇති සිය ගනන් වූ ජීවිත හානි හේතු කොට ගෙන දකුනෙහි වෙසෙන සිංහල කම්කරුවන් අතර යුද විරෝධී හැඟීම වැඩෙමින් තිබෙන අතර (හමුදා සොල්දාදුවන්ගෙන් බොහෝ දෙනා දුගී ගොවීහු ය), ආන්ඩුව ඉහල නැගෙන යුද වියදම්වල ආර්ථික බර වැඩ කරන ජනයාගේ කර මත පටවමින් සිටියි. ආහාර, ඉන්ධන හා ප්‍රවාහන මිල ගනන් අහස අසට නගිද්දී රාජපක්ෂ දුගීන් සඳහා සැපයෙන අත්‍යවශ්‍ය සේවාවන් සහ සහනාධාර කප්පාදු කර දමා ඇති අතර, ජීවන තත්ත්වයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කර ගැනීම සඳහා වූ අරගල ජනවාර්ගික රේඛා කපා ගෙන වර්ධනය වෙමින් තිබේ. මේ පසු ගිය සතියේ, ඉහල වැටුප් ඉල්ලීම උදෙසා ගුරුවරුන් ගෙන ගිය විරෝධතා ව්‍යාපාරයකට එරෙහිව ආන්ඩුව දින දෙකක් රජයේ පාසල් වසා දැමී ය.

ජූනි 6 වන දා කම්කරුවන් රැගෙන යමින් තිබූ බස් රියක් තුල පුද්ගලයන් 21 දෙනෙකු ඝාතනය කරමින් සිදු වූ බෝම්බ පිපිරීමෙන් පසුව, රාජපක්ෂ වහා ම එම සිද්ධිය ඩැහැ ගත්තේ, "අපේ රටෙන් ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ කටයුත්තේ දී දිගින් දිගට ම පොලීසියටත් ආරක්ෂක හමුදාවලටත් සහාය වෙන්නැ"යි ජනතාවට කැඳවුම් කරමිනි. අනතුරුව සිදු වූ බෝම්බ පිපිරවීම්වලින් පසුව, රාජපක්ෂ හා සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් යුද ප්‍රයත්නය පිටුපස පෙල ගැසීමට ජනයා කුලප්පු කිරීමටත් සමාජ

නොසන්සුන්තාව මර්දනය කිරීමටත් උත්සාහ ගැනීමත් සමග, එවැනි කැඳවුම් සමූහ ගායනා බවට පත්ව තිබේ.

2002 දී, සටන් විරාම ගිවිසුමකට අත්සන් තැබූ එල්ටීටීඊය, එවක පැවති එක්සත් ජාතික පක්ෂ (එජාප) ආන්ඩුව ආරම්භ කල ඊනියා සාම ක්‍රියා දාමයට ඇතුලු විය. මහා ව්‍යාපාරිකයෝ ද එක්සත් ජනපදය හා යුරෝපා සංගමය ඇතුලු ප්‍රධාන බලවත්තු ද එල්ටීටීඊය කොලඹ ප්‍රභූවේ කනිෂ්ඨ හවුල්කරුවෙකු ලෙස බඳවා ගැනීමේ මාධ්‍යයක් වශයෙන් සලකා මේ ගනුදෙනුවට සහාය දුන්හ. එල්ටීටීඊ නායකයෝ සිය ගරිල්ලා හමුදා නිල ඇඳුම් අත් හැරීමටත් ශ්‍රී ලංකාව "ව්‍යාඝ්‍ර ආර්ථිකයක්" බවට පරිවර්තනය කිරීමේ දී ඊට සහාය දීමටත් පවත්නා සිය සූදානම පල කලහ. ("ව්‍යාඝ්‍ර ආර්ථිකයක්" යනු විදේශීය ආයෝජකයන් උදෙසා ලාභ ශ්‍රම වේදිකාවක් නිර්මානය කිරීම උදෙසා යොදා ගැනෙන යහනාමයකි.)

මේ අතරතුරේ ම, දේශපාලන විරුද්ධත්වය මතු වී ඒම මර්දනය කරනු වස්, එල්ටීටීඊය සිය පාලනය යටතේ තිබූ දෙමල ජන ප්‍රදේශ තුල මර්දනකාරී තන්ත්‍රයක් පවත්වා ගෙන ගියේ ය. සටන් විරාම ගිවිසුම ඒකපාර්ශ්විකව බිඳ දැමීමෙන් අනතුරුව, 2006 දී රාජපක්ෂ එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් කුඩු කර දැමීම සඳහා හැරී ගත් අතර, එය උතුරෙහි සහ නැගෙනහිරෙහි ව්‍යාපාර හිතවාදී තමන්ගේ ම පාලන තන්ත්‍රයක් ස්ථාපනය කර ගැනීමට එල්ටීටීඊ නායකයන්ට පැවති අපේක්ෂාව වනසා දැමුනි.

ආන්ඩුව යලි යුද්ධය දියත් කල තැන් පටන් එල්ටීටීඊයට සිය පාලනය යටතේ පැවති නැගෙනහිර ප්‍රදේශ අහිමි වී ගොස් තිබේ. එය ලද පරාජයන් හා බැඳී පැවති එක් සාධකයක් වූයේ 2004 දී නැගෙනහිර පලාතේ අම්පාර-මඩකලපු දිස්ත්‍රික්කවල එහි අන දෙන නිලධාරියාව සිටි කරුනා හෙවත් වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් කන්ඩායමක් ඉන් කැඩී වෙන් වීම යි. නැගෙනහිරෙහි තමන්ගේ ම ක්ෂුද්‍ර-රාජ්‍යයක් ගොඩ නගා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටින මේ පැරා මිලිටරි කන්ඩායම කොලඹ යුද ආක්‍රමනය සමග සන්ධානගත වී ඇත.

කොසෝවෝවේ සිදු වූ ආකාරයට වෙන ම දෙමල ඊලමක් පිලිබඳ තම අරමුනට සහාය ලබා ගැනීමට එල්ටීටීඊය යලි වතාවක් මහ බලවතුන් වෙත හැරී තිබේ. එහෙත් එවන් යෝජනාවකට සහාය දීමෙහි ලා වොෂින්ටනයට කිසිදු අවශ්‍යතාවක් නැත. දකුනු ආසියාව තුල බුෂ් පාලනාධිකාරයේ ප්‍රධාන ඉලක්කය ලෙස පවතින්නේ චීනයට එරෙහි මූලෝපායාත්මක ප්‍රතිභාරයක් බවට පත් වීමට ඉන්දියාවට දිරි දීම යි. දෙමල රාජ්‍යයක් උදෙසා වූ එල්ටීටීඊයේ කැඳවුමෙන් සිදු වනු ඇත්තේ තමිල් නාඩුව හා අනෙකුත් දකුනු ඉන්දියානු ප්‍රාන්ත අස්ථාවර භාවයට පත් වීම පමනකැයි එය තැති ගෙන සිටී. 2006 දී, එක්සත් ජනපදය යෙදූ පීඩනයේ ප්‍රතිඵලයක් ලෙස, යුරෝපා බලවත්තු සහ කැනඩාව එල්ටීටීඊය "ත්‍රස්තවාදී" කන්ඩායමක් යැයි සලකා තහනම් කලහ.

එල්ටීටීඊයේ වාර්තාවෙන් පැහැදිලි වන්නේ, දෙමල ජනතාව සහ සියලු ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් ගත් විට ජනවාර්ගික බෙදුම්වාදය වනාහි ආවෘත අන්තයක් ය යන්න යි. දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී සහ සාමාජීය අභිලාෂයන් මුදුන් පමුනුවා ගත හැකි වනු ඇත්තේ, ආන්ඩුවේ හමුදා උතුරෙන් සහ නැගෙනහිරෙන් කොන්දේසි විරහිතව ඉවත් කිරීම ද දකුනු ආසියාව තුල හා ජාත්‍යන්තර වශයෙන් සමාජවාදය සඳහා ගෙන යන වඩා පුලුල් සටනේ කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ස්ථාපනය කිරීම ද උදෙසා සිංහල හා මුස්ලිම් කම්කරුවන් සමග ඒකාබද්ධ අරගලයක් ගෙන යාමෙන් පමනකි.

© www.wsws.org